# නාලන්දා විද්‍යාලය-කොළඹ 10

## ඒකක පරීක්ෂණය

11ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 7-ඒකකය

## නිෂ්පාදන පිරිවැය ලේඛනය

### I - කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. භාණ්ඩයක් නිෂ්පාදනයේදී එක් එක් ඒකකයක් පාසා පැහැදිලිව හඳුනාගත හැකි භෞතික සම්පත්වල පිරිවැය.
    (1). සෘජු ද්‍රව්‍ය පිරිවැයයි
    (2). සෘජු වෙනත් පිරිවැයයි
    (3). වක්‍ර ද්‍රව්‍ය පිරිවැයයි
    (4). නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයයි

02. ප්‍රාථමික පිරිවැය = A + B + C
    ඉහත A, B සහ C අක්ෂර සඳහා යෙදිය යුතු පිරිවැය මූලිකාංග පිළිවෙලින් සඳහන් පිළිතුර වනුයේ,
    (1). වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය + වක්‍ර වෙනත් පිරිවැය
    (2). සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
    (3). සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය + සෘජු වෙනත් පිරිවැය
    (4). සෘජු ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + කම්හල් පිරිවැය

03. ඇඟළුම් නිෂ්පාදන ව්‍යාපාරයක මැෂින් ක්‍රියාකරවන්නියකගේ වැටුප රු. 35 000 කි. මෙම වියදම අයත් වන්නේ,
    (1). සෘජු ශ්‍රම පිරිවැයටය
    (2). වක්‍ර ශ්‍රම පිරිවැයටය
    (3). සෘජු වෙනත් පිරිවැයටය
    (4). නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයටය

➢ හෙල ගාමන්ට් ආයතනයේ නිෂ්පාදන පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | 310 000 | වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 175 000 |
| සෘජු ශ්‍රම පිරිවැය | 142 000 | වක්‍ර ශ්‍රම පිරිවැය | 85 000 |
| සෘජු වෙනත් පිරිවැය | 93 000 | වක්‍ර වෙනත් පිරිවැය | 20 000 |

ඉහත තොරතුරු උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

04. හෙල ආයතනයේ සෘජු නිෂ්පාදන පිරිවැය වන්නේ,
    (1). 280 000 (2). 310 000 (3). 175 000 (4). 545 000

05. හෙල ආයතනයේ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වන්නේ,
    (1). 280 000 (2). 175 000 (3). 545 000 (4). 310 000

06. හෙල ආයතනයේ මුළු නිෂ්පාදන පිරිවැය අගය කොපමණද?

(1). 545 000 (2). 265 000 (3). 825 000 (4). 280 000

- **සත්‍ය ද අසත්‍ය ද දක්වන්න. (ප්‍රශ්න අංක 07 සිට 09 දක්වා)**

07. භාණ්ඩ නිපදවා විකුණන ආයතනයක් නිෂ්පාදන ආයතනයක් ලෙස සැලකේ ....................................

08. නිෂ්පාදන ආයතනයක ප්‍රධාන කාර්ය භාණ්ඩ හෝ සේවා විකිණීමයි ......................................

09. වක්‍ර පිරිවැය, නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ලෙසද හැඳින්වේ. ....................................

- **ප්‍රශ්න අංක 10 සිට 14 තෙක් ප්‍රශ්න සඳහා පහත තොරතුරු උපයෝගී කර ගන්න.**

චෛතිය ව්‍යාපාරයේ 2018.12.31 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය තොරතුරු,

| | |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | රු. 150 000 |
| කම්හල් සේවක වැටුප් | රු. 18 000 |
| අමුද්‍රව්‍ය ප්‍රවාහන කුලිය (ඍජු/වෙනත්) | රු. 2 400 |
| ඍජු වැටුප් | රු. 35 000 |
| විදුලිය වියදම් | රු. 11 600 |
| කම්හල් කුලිය සහ වෙනත් වියදම් | රු. 23 000 |
| නිෂ්පාදන ඒකක ප්‍රමාණය | රු. 2 000 |

10. චෛතිය ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය වන්නේ,

(1). රු. 240 000 (2). රු. 187 400 (3). රු. 52 600 (4). රු. 130 400

11. මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

(1). රු. 52 600 (2). රු. 187 400 (3). රු. 130 400 (4). රු. 240 000

12. භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය කොපමණද?

(1). රු. 93.70 (2). රු. 120.00 (3). රු. 26.30 (4). රු. 65.20

13. නිෂ්පාදන පිරිවැය 10% ක ලාභාන්තිකයක් එකතු කර මිල ලකුණු කරයි නම්, භාණ්ඩ ඒකකයක මිල වන්නේ,

(1). රු. 132.00 (2). රු. 103.07 (3). රු. 28.93 (4). රු. 71.72

14. භාණ්ඩ විකිණීමෙන් චෛතිය ව්‍යාපාරය ලැබූ මුළු ආදායම වන්නේ,

(1). රු. 143 440 (2). රු. 57 860 (3). රු. 206 140 (4). රු. 264 000

15. නිෂ්පාදන පිරිවැය ලේඛන සකස් කිරීම සඳහා භාවිතා කළ හැකි පරිගණක පැතුරුම්පත් මෘදුකාංගයක් නොවන්නේ,

(1). Libreoffice calc (3). MS Excel

(2). Google sheets (4). MYOB

## II - කොටස

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. නිෂ්පාදන පිරිවැය යනුවෙන් හැඳින්වෙනුයේ කුමක්ද?

02. නිෂ්පාදන පිරිවැය මූලිකාංග 06 නම් කරන්න.

03. ඒ අතුරින් පිරිවැය මූලිකාංග 04 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. මල් පෝච්චි නිෂ්පාදනය කරන සරත්ගේ ව්‍යාපාරයේ 2020 ජුනි මස පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| සිමෙන්ති, වැලි සහ ගල්කුඩු | රු. 130 000 |
| නිෂ්පාදන සේවක වැටුප් | රු. 22 000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | රු. 5 400 |
| කම්හල් විදුලි බිල | රු. 1 000 |
| කම්හල් සේවක වැටුප් | රු. 15 000 |
| වෙළඳසැල් කුලිය (කම්හල්) | රු. 2 500 |
| තීන්ත | රු. 4 100 |

- 2020 ජුනි මාසයේ මල් පෝච්චි 500 ක් නිපදවූහ.
- මිල කිරීමේදී 10% ක ලාභාන්තිකයක් තබාගෙන මිල සටහන් කර ඇත.

ඉහත තොරතුරු භාවිතා කරමින් නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කරන්න. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). ඉහත සඳහන් තොරතුරු (අයිතම) ''ඍජු පිරිවැය'' හා ''වක්‍ර පිරිවැය'' යටතේ වෙන් කර ලියා දක්වන්න. (වටිනාකම් අවශ්‍ය නොවේ)

(ii). ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වෙන වෙනම දක්වන්න.

(iii). මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද?

(iv). එක් නිෂ්පාදන ඒකකයක (මල් පෝච්චියක) පිරිවැය කොපමණද?

(v). මල් පෝච්චියක විකුණුම් මිල ගණනය කරන්න.

(vi). සරත්ගේ ව්‍යාපාරය 2020 ජුනි මාසයේ ලැබූ ලාභය ගණනය කරන්න.

*සැකසුම: ඉමේෂා ලක්ෂ්මන්*